# ලංකා ගුරුසේවා සංගමය
# இலங்கை ஆசிரியர் சேவை சங்கம்
# Ceylon Teachers Service Union

C.T.S.U

259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම
259/9, செத்சிறி மாவத்தை, கொஸ்வத்தை, தலங்கம
259/9, Sethsiri Mawath,Koswatta, Thalangama

දුරකතන / தொ.பே. / Tel. } 011 2075313
ෆැක්ස් / பெக்ஸ் / Fax } 011 2075313

E-Mail :- ctsuhq@gmail.com
Web :- www.unions.lk


| | | | |
|---|---|---|---|
| අපේ යොමුව / எங்கள் இல. / Our No. ල.ගු.සේ.ස./අ.අමා./2018/ | ඔබේ යොමුව / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2018.08.24. | ලියාපදිංචි අංකය / பதிவு இலக்கம் / Registration No. } 6452 |

# ජනමාධ්‍ය නිවේදනයයි.

**<u>විදුහල්පතිනිය දණ ගැස්සවීමේ ආණ්ඩුකාර විමර්ශන වාර්තාව හොරාගෙන්ම පෙන ඇසීමක් වැනිය.</u>**

ඌව මහ ඇමති චාමර සම්පත් දසනායක විසින් බදුල්ල දෙමළ බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය වූ ආර්. භවානි මහත්මිය දණ ගැස්සවීමේ සිද්ධියට අදාලව ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ නියමයෙන් පත්කළ විමර්ශන නිළධාරින් සිදුකළ විමර්ශනයකට අනුව ''අදාළ විදුහල්පතිනිය දණගැස්ස වීමක් සිදු නොකළ බවට'' ලබාදී ඇති වාර්තාවේ සඳහන් වේ. මෙය හොරාගෙන්ම පේන ඇසීමකට නොදෙවෙනි කරුණක් බව අපි අවධාරණයෙන්ම කියමු.
පාසලක පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීමට අධ්‍යාපන ලේකම් විසින් නිකුත් කරනලද චක්‍රලේඛ මගින් ඊට අදාල විධිමත් ක්‍රියා පටිපාටියක් පෙන්වා දී තිබියදී එය උල්ලංඝනය කරමින් දේශපාලන හිතවතුන්ගේ දරුවන් පාසලට ඇතුලත් කිරිමට සිදුකරන ලද බලපෑම මෙහි මුලික චෝදනාවකි.
මහ ඇමති වරයාගේ මෙම පටු දේශපාලන වුවමනාව වෙනුවෙන් රාජ්‍ය නිළධාරින් ලෙස ඌව පළාත් අධ්‍යාපන ලේකම්වරිය, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මෙම විදුහල්පතිනියට මේ සඳහා බලපෑම් කිරීමත්, එතැනින් නොනැවති ඒ සදහා මහ ඇමතිවරයාගේ නිළ නිවස වෙත රැගෙන යාමත්, එහිදී මහ ඇමතිවරයා විසින් මෙම විදුහල්පතිනියට එල්ල කළ පීඩාව හා පසුව එම සිද්ධිය යටපත් කිරීමට සිදුකළ බලපෑම මෙහි මුලික විමර්ශනයට ලක් විය යුතු කරුණු වේ. එසේ නොමැතිව මෙහි එල්ල වු පීඩාවේ ප්‍රතිඵලයක් ලෙස දණ ගැස්සවිම, දණගැසීම හෝ එවැනි කිසිවක් නොකර සිටිම හෝ මෙම විමර්ශනය අවසන් නිගමනයට අදාළ මුලිකවු කරුණක් නොවේ.
මෙහි වැදගත් වනුයේ මහ ඇමතිවරයා විසින් මෙම විදුහල්පතිනියට තම දේශපාලන බලය අනිසි ලෙස යොදා ගනිමින් අනීතික ක්‍රියාවක් සඳහා බලපෑම් සිදුකර තිබේද? නැද්ද? යන බවයි. නමුත් ආණ්ඩුකාරවරයාගේ නියමයෙන් පත්කළ මෙම විමර්ශන නිලධාරින් සිදුකර ඇත්තේ '' යන්නේ කොහේදැයි ඇසු විට මල්ලේ පොල් යැයි '' කීම වැනි විමර්ශනයකි.
එහෙයින් අදාල විමර්ශනයේ අවසන් නිගමනය ලෙස මෙම සිද්ධියේදී මහ ඇමති වරයාට එල්ල වන බරපතල චෝදනා සඟවා ඔහු හා ඔහුගේ නිළධාරින් ආරක්ෂා කිරිමට ඌව පළාත් ආණ්ඩුකාර වරයා තම නිළධාරින් හරහා ගෙන ඇති මෙම නිර්ලජ්ජිත උත්සාහය ලංකා ගුරු සේවා සංගමය දැඩි පිළිකුලෙන් යුතුව හෙලා දකින අතර, අදාල විමර්ශන වාර්තාව වහා ඉවත් කර ගන්නා ලෙස බලකර සිටිමු.

මෙයට

මහින්ද ජයසිංහ
ප්‍රධාන ලේකම්
ලංකා ගුරුසේවා සංගමය.